# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2053/20 – 2018 ජනවාරි මස 10 වැනි බදාදා – 2018.01.10

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 3/2006

**2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත**

මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 2 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති.

මූල්‍ය බුද්ධි ඒකකය

2018 ජනවාරි මස 10 වැනි දින,
කොළඹ දී ය.

**රීති**

1. මෙම රීති 2018 අංක 1 දරන නමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාර (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම රීති (මෙහි මින්මතු ''මූල්‍ය නොවන ව්‍යාපාරය'' යනුවෙන් සඳහන් කරනු ලබන) පහත දැක්වෙන නමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාරවලට අදාළ විය යුතු ය.

(අ) තම ගනුදෙනුකරුවන් 9 වන රීතියේ (2) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති නියමිත සීමාවට සමානව හෝ එය ඉක්මවා, මූල්‍යමය ගනුදෙනුවල යෙදී සිටින විට, අන්තර්ජාලය මගින් එවැනි යම් ව්‍යාපාරයක් කරගෙන යන තැනැත්තකු ද ඇතුළුව කැසිනෝ, සූදු ගෙවල් හෝ ලොතරැයියක් පවත්වාගෙන යාම;


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(ආ) නිශ්චල දේපළ මිලට ගැනීම හා විකිණීමට අදාළව, තම ගනුදෙනුකරුවන් සඳහා ගනුදෙනුවල යෙදෙන නිශ්චල දේපළ අනුයෝජිතයන්;

(ඇ) 9 වන රීතියේ (2) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති නියමිත සීමාවට සමානව හෝ එය ඉක්මවා, ගනුදෙනුකරුවකු, සමඟ මුදල් ගනුදෙනුවල නිරත වනවිට, 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනතින් ආවරණය වන ලෝහ හා ගල් ඇතුළුව, එහෙත් ඒවාට සීමා නොවූ, වටිනා ලෝහ වෙළෙඳුන් සහ මැණික් ගල් හා අඩ මැණික් ගල් වෙළෙඳුන්;

(ඈ) පහත දැක්වෙන කටයුතු අතුරෙන් කිසිවකට අදාළව, තම සේවාදයකයන් වෙනුවෙන් ගනුදෙනු සඳහා සූදානම් වනවිට හෝ ඒවා කරගෙන යන විට, නීතිඥවරුන්, නොතාරිස්වරුන්, වෙනත් ස්වාධීන නීති වෘත්තිකයන් හා ගණකාධිකාරීවරුන්:-

(i) නිශ්චල දේපළ මිලට ගැනීම හා විකිණීම;

(ii) සේවාදයක මුදල්, ඇප හෝ වෙනත් වත්කම් කළමනාකරණය;

(iii) බැංකුවේ ඉතිරිකරගත් මුදල් හෝ ඇප ගිණුම් කළමනාකරණය කිරීම;

(iv) සමාගම් ඇති කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ කළමනාකරණය කිරීම සඳහා දයක මුදල් සංවිධානය කිරීම; සහ

(v) නෛතික පුද්ගලයින් හෝ නෛතික වැඩ පිළිවෙළ ඇති කිරීම, මෙහෙයවීම හෝ කළමනාකරණය කිරීම හෝ ව්‍යාපාර අස්ථිත්ව පිළියෙල කිරීම, මිලට ගැනීම හා විකිණීම;

(ඉ) (අ) සිට (ඈ) දක්වා ඡේදවලින් අන්‍යාකාරයකින් ආවරණය නොවන්නා වූ, ව්‍යාපාරයක් වශයෙන් තුන්වන පාර්ශ්වයන්ට පහත දැක්වෙන සේවාවන් එකක් හෝ වැඩි ගණනක් සපයන්නා වූ භාරයක් හෝ සමාගම් සේවා සපයන්නෙක්:-

(i) නෛතික පුද්ගල සැකසුම හෝ කළමනාකරණය;

(ii) සමාගමක අධ්‍යක්ෂවරයකු හෝ ලේකම්වරයකු, කොටස්කරුවකු හෝ හවුල් ව්‍යාපාරයක් වශයෙන් හෝ වෙනත් නෛතික පුද්ගලයින්ට අදාළව සමාන තත්ත්වයකින් ක්‍රියා කිරීම හෝ ක්‍රියාකිරීම සඳහා වෙනත් තැනැත්තකු වෙනුවෙන් කටයුතු පිළියෙල කිරීම;

(iii) සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් යම් නෛතික පුද්ගලයෙක් හෝ නියමිත ස්ථානයක් සඳහා ලියාපදිංචි කරන ලද කාර්යාලයක්, ව්‍යාපාරික ලිපිනයක් හෝ ඉඩකඩ, තැපැල් මාර්ගික හෝ පරිපාලනමය ලිපිනයක් ලබාදීම ;

(iv) ප්‍රකාශිත භාරයක භාරකරුවකු වශයෙන් ක්‍රියාකිරීම හෝ ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු සූදානම් කිරීම ; සහ

(v) වෙනත් තැනැත්තකු වෙනුවෙන් නාමික කොටස්කරුවකු වශයෙන් ක්‍රියාකිරීම හෝ ක්‍රියාකිරීම සඳහා වෙනත් තැනැත්තකු සූදානම් කිරීම ;

3. සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින්ම තම ගනුදෙනුකරුවන් වෙතින් යොමුවන මුදල් විශුද්ධිකරණ අවදනම් සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදනම් හඳුනාගැනීමේ, තක්සේරු කිරීමේ හා කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා අවදනම මත පදනම් වූ පිවිසුම මත පිහිටා (මෙහි මින්මතු ''නිසි උද්යෝගය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ගනුදෙනුකරුවන් පිළිබඳ නිරන්තර නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීම මගින්, මේ රීතිවල නිශ්චිතව සඳහන් කරනු ලබන පියවර ගනු ලැබිය යුතු ය.

## I වන කොටස

## මුදල් විශුද්ධිකරණ අවදනම සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදනම

**සාමාන්‍ය අවදනම් කළමනාකරණය**

4. අවදනම කළමනාකරණය කිරීමේ කර්තව්‍යවල තීව්‍ර බව සහ පෘථුල බව ''අවදනම මත පදනම් වූ පිවිසුමට'' අනුකූල විය යුතු අතර මූල්‍ය නොවන ව්‍යාපාරයේ ක්‍රියාකාරකම්වල මුදල් විශුද්ධිකරණ අවදනමේ සහ ත්‍රස්ත්‍රවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදනමේ ස්වභාවය, තත්ත්වය සහ සංකීර්ණ බවට සමානුපාතික විය යුතු ය.

5. සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක්ම, එහි ගනුදෙනුකරුවන්ට, රටවලට හෝ භූගෝලීය ප්‍රදේශවලට, නිෂ්පාදනවලට, සේවාවලට, ගනුදෙනුවලට සහ බෙදාහැරීමේ මාර්ගවලට අදාළව, එහි මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම පිළිබඳ අවදානම් හඳුනාගැනීමට, තක්සේරු කිරීමට සහ කළමනාකරණය කිරීමට 6 වන සහ 7 වන රීතිවලට අනුකූලව යෝග්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

6. 7 වන රීතියේ විධිවිධානවලට යටත්ව, ව්‍යාපාරික සම්බන්ධතාවකට හෝ යම් ගනුදෙනුවකට එළඹෙන්නා වූ සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින් ම-

(අ) (i) සමස්ත අවදානම් මට්ටම සහ අදළ වන අවදානම් මට්ටම සහ අදළ කරගත යුතු අවදානම අවම කිරීමේ මාර්ග කුමන ආකාරයේ ද, යන්න තීරණය කිරීමට පෙරාතුව, අදළ සියලු අවදානම් සාධක සැලකිල්ලට ගැනීම ;

(ii) ස්වකීය අවදානම් තක්සේරු කිරීම් සහ අනාවරණය කිරීම් ලේඛනගත කිරීම් ;

(iii) වරින්වර සිදුකරන සමාලෝචන මගින් යාවත්කාලීන තක්සේරු කිරීමක් පවත්වාගෙන යාම ; සහ

(iv) යෝග්‍ය යාන්ත්‍රණයක් හරහා අධීක්ෂණ අධිකාරිය වෙත අවදානම් තක්සේරු කිරීමේ තොරතුරු සැපයීම,

ඇතුළුව නිසි අවදානම් තක්සේරු කිරීමක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය ;

(ආ) (i) හඳුනාගෙන ඇති මුදල් විශුද්ධිකරණ අවදානම සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානම කළමනාකරණය කිරීම හා අවම කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති, පාලනය කිරීම් සහ කාර්ය පටිපාටි පවත්වාගෙන යාම ;

(ii) එම ප්‍රතිපත්තිය, පාලනය කිරීම් සහ කාර්ය පටිපාටි ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම සහ අවශ්‍ය වේ නම් ඒවා වැඩි දියුණු කිරීම ;

(iii) වැඩි අවදානම් හඳුනාගෙන ඇති අවස්ථාවක දී, ඒ අවදානම් කළමනාකරණය කිරීමට සහ අවම කිරීමට ප්‍රවර්ධිත පියවර යොදා ගැනීම; සහ

(iv) අඩු අවදානමක් හඳුනාගෙන ඇති අවස්ථාවක දී සරල පියවර යොදා ගැනීම,

ඇතුළුව යෝග්‍ය අවදානම් පාලනය කිරීමේ සහ අවදානම් අවම කිරීමේ පියවර ගනු ලැබිය යුතුය;

(ඇ) (i) ගනුදෙනුකාර පන්තියට අනුව අවදානම් මට්ටම (උදා:- නේවාසික හෝ අනේවාසික, කලින් කල හෝ එක්වරක් පමණක් පැමිණෙන ගනුදෙනුකරුවන්, නෛතික තැනැත්තන්, දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තන් සහ විවිධ රැකියාවල නිරත ගනුදෙනුකරුවන් වැනි විවිධ ප්‍රභේදවල ගනුදෙනුකරුවන්);

(ii) ගනුදෙනුකරුගේ ව්‍යාපාරයේ භූගෝලීය පිහිටීම හෝ ගනුදෙනුකරුගේ උපන් රට හෝ ඒ දෙකම;

(iii) ගනුදෙනුකරුගේ නිෂ්පාදන සේවා, ගනුදෙනු හෝ බෙදාහැරීමේ මාර්ග (උදා:- මුදල් පදනම් වූ සම්මුඛ හෝ ප්‍රතිමුඛ දේශසීමාව හරහා); සහ

(iv) ගනුදෙනුකරුට අදාල වෙනත් යම් තොරතුරු,

සැලකිල්ලට ගනිමින් ස්වකීය ගනුදෙනුකරුවන් පිළිබඳ අවදානම් පැතිකඩ සැකසීම පවත්වාගෙන යා යුතු ය;

(ඈ) ගනුදෙනුකරුවෙක් වශයෙන් ආරම්භකව පිළිගැනීමෙන් පසුව, එම ගනුදෙනුකරුගේ මුදල් විශුද්ධිකරණ අවදානමේ සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානමේ මට්ටම මත පිහිටා ඔහුගේ අවදානම් පැතිකඩ නිරතුරුවම අධීක්ෂණය කර යාවත්කාලීන කරනු ලැබිය යුතු ය;

(ඉ) එක් එක් ගනුදෙනුකරුවකු හෝ ගනුදෙනුකාර පන්තියක් සඳහා අදාළ විය යුතු අවදානම් පාලනය කිරීමේ සහ අවම කිරීමේ පියවර ඒ ගනුදෙනුකරු හෝ ගනුදෙනුකාර පන්තියේ තක්සේරු කරන ලද අවදානම් මට්ටම සමඟ අනුරූප විය යුතුය;

(ඊ) මුදල් විශුද්ධිකරණයට එරෙහිව සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ තත්කාලයේ බලපවත්වන ලිඛිත නීතිවලට යටත් ව ස්වකීය ජ්‍යෙෂ්ඨ කළමනාකරණය හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අභ්‍යන්තර ප්‍රතිපත්තියක් සකස් කළ යුතු ය;

(උ) පහත දැක්වෙන කරුණු ඇතුලුව, (ඊ) ඡේදය යටතේ සකස් කරන ලද ප්‍රතිපත්තිවලට අනුකූලව විස්තරාත්මක කාර්ය පටිපාටිය සහ පාලන ක්‍රම වැඩිදියුණු කරනු ලැබිය යුතු ය:-

(i) නිසි උද්යෝගයට අදාළ පියවර මෙහෙයවීම සහ වාර්තා තබා ගැනීමේ යාන්ත්‍රණය පවත්වාගෙන යාම;

(ii) අසාමාන්‍ය සහ සැක කටයුතු ගනුදෙනු සොයා ගැනීම සහ අභ්‍යන්තර ලෙස වාර්තා කිරීමේ කාර්ය පටිපාටිය පවත්වාගෙන යාම;

(iii) මූල්‍ය බුද්ධි ඒකකය වෙත සැක කටයුතු ගනුදෙනු වාර්තා කිරීම;

(iv) ස්ථිර පදනම මත හෝ අන්‍යාකාරයකින් සේවා නියුක්තිකයන් පත් කිරීමේ දී හෝ කුලියට ගැනීමේ දී සේවා නියුක්තිකයන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකර පිරික්සුම් කිරීමේ පරිපූර්ණ කාර්ය පටිපාටියක් සකස් කර ක්‍රියාත්මක කිරීම;

(v) අදාළ ලිඛිත නීතිවලට යටත්ව ස්වාධීන විගණන කර්තව්‍ය පවත්වාගෙන යාම;

(vi) සැක කටයුතු ගනුදෙනු හඳුනාගැනීම, මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානම ඵලදායි ලෙස කළමනාකරණය කිරීම සඳහා අදාළ සේවා නියුක්තයන් පුහුණු කිරීම.

**තනි වෘත්තිකයන් සහ හිමිකරුවන්**

7. 6 වන රීතියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, (මෙහි මින්මතු ''පනත'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ අර්ථානුකූලව ස්වකීය සේවාදායකයන් සඳහා යම් ගනුදෙනුවල යෙදී සිටින තනි වෘත්තිකයන් හෝ තනි හිමිකරුවන් වන නීතිඥවරුන්, නොතාරිස්වරුන්, වෙනත් ස්වාධීන නීති වෘත්තිකයන් සහ ගණකාධිකාරිවරුන් විසින්, අදාළ ක්ෂේත්‍රයට ඉදිරිපත් වූ අවදානම් මට්ටම සැළකිල්ලට ගනිමින්, කලින් කලට, පනතට සහ ඒ යටතේ නිකුත් කරන ලද යම් නියෝග හෝ රීතිවලට යටත්ව මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු ය.

**සමූහ සමාගම්**

8. (1) සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින් ම, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමට විරුද්ධ වීමේ දී ශ්‍රී ලංකාවට වඩා දැඩි බවින් අඩු නෛතික විධිවිධාන සලසන යම් රටක් තුළ විදේශීය ශාඛා හෝ බහුතර හිමිකාරත්වය ඇති පාලිත සමාගම් ක්‍රියාත්මක කරන්නේ නම්, මෙම රීතිවලට අනුකූලව ක්‍රියා කිරීමට වගබලා ගත යුතු ය.

(2) අදාළ විදේශීය රටේ නීති යටතේ (1) වන ඡේදයේ විධිවිධාන සලසා ඇති පරිදි ක්‍රියා කිරීමට ඉඩ ලබා නොදෙන අවස්ථාවක දී, එවැනි සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින් ම, අදාළ විදේශීය රටේ නීතියට පරස්පර විරෝධී නොවන යෝග්‍ය පියවර ක්‍රියාත්මක කළ යුතු අතර මූල්‍ය බුද්ධි ඒකකයට සහ අදාළ අධීක්ෂණ අධිකාරියට ඒ බව දැනුම් දිය යුතු ය.

## II වන කොටස

## ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම (නිසි උද්යෝගය)

**සාමාන්‍ය නිසි උද්යෝගය**

9. (1) පනතේ 2 වන වගන්තියේ කාර්යය සඳහා, මේ කොටසේ විධිවිධානවලට යටත්ව මෙම රීතිවල නිශ්චිතව සඳහන් කර ඇති නිසි උද්යෝගයේ පියවර සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින් ම ක්‍රියාත්මක කළ යුතු ය.

(2) (1) වන ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද එය නොතකා, පහත දැක්වෙන අනු-ඡේදවල නිශ්චිතව දක්වා ඇති ඕනෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින්, ඒ එක් එක් අනු-ඡේදයේ නිශ්චිතව දක්වා ඇති අවස්ථාවන් සඳහා, මේ කොටසේ නිශ්චිතව දක්වා ඇති නිසි උද්යෝගයේ පියවරවල් ක්‍රියාත්මක කළ යුතුය:-

(අ) ගනුදෙනුකරුවකු ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් ඇමෙරිකන් ඩොලර් 3,000 කට සමාන හෝ ඊට වැඩි මූල්‍ය ගනුදෙනුවකට සම්බන්ධ වන විටක දී, කැසිනෝ, සූදු ගෙවල් හෝ ලොතරැයියක් පවත්වාගෙන යාම, අන්තර්ජාලය මගින්, එවැනි ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නා වූ තැනැත්තන් ද ඇතුළුව; හෝ

(ආ) ගනුදෙනුකරුවකු ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ ඕනෑම විදේශීය ව්‍යවහාර මුදලකින් ඇමෙරිකන් ඩොලර් 15,000 කට සමාන හෝ ඊට වැඩි යම් මූල්‍ය ගනුදෙනුවකට අදාළ වෙළෙන්දා සමඟ සම්බන්ධ වන විටක, 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතෙන් ආවරණය වන ලෝහ සහ ගල් ඇතුළුව එහෙත්, ඒවාට සීමා නොවූ වටිනා ලෝහ වෙළෙන්දන් සහ මැණික් ගල් සහ අඩ මැණික් ගල් වෙළෙන්දන්,

10. මේ කොටසේ කාර්ය සඳහා, සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින් ම -

(අ) ගනුදෙනුකරු හඳුනාගැනීම සහ විශ්වාස කටයුතු, ස්වාධීන ලේඛන ප්‍රභව, දත්ත හෝ තොරතුරු භාවිත කරමින් ඒ ගනුදෙනුකරුගේ අනන්‍යතාවය සත්‍යායනය කිරීම කළ යුතු ය.

(ආ) ගනුදෙනුකරු වෙනුවෙන් ක්‍රියාකිරීමට උද්දේශිත යම් තැනැත්තකුට එසේ බලය තිබේ ද යන්න තහවුරු කරගෙන ඒ තැනැත්තා හඳුනාගත යුතු අතර ඒ තැනැත්තාගේ අනන්‍යතාවය සත්‍යායනය කළ යුතු ය;

(ඇ) ප්‍රතිලාභී හිමිකරු හඳුනාගත යුතු අතර මූල්‍ය නොවන ව්‍යාපාරය විසින් ප්‍රතිලාභී හිමිකරු කවුරුද යන්න ඔවුන් හඳුනන බවට සෑහීමට පත්වීම සඳහා විශ්වසනීය මූලාශ්‍රයකින් ලබාගත් අදාළ තොරතුරු හෝ දත්ත භාවිත කරමින් ප්‍රතිලාභී හිමිකරුගේ අනන්‍යතාවය සත්‍යායනය කිරීමට පියවර ගනු ලැබිය යුතු ය;

(ඈ) ව්‍යාපාර සම්බන්ධතාවයේ අපේක්ෂිත අරමුණු හා ස්වභාවය තේරුම් ගත යුතු අතර අදාළ අවස්ථාවල දී ඒ පිළිබඳ තොරතුරු ලබා ගත යුතු ය.

11. සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින් ම, අවම වශයෙන්, නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ කාර්යය සඳහා ගනුදෙනුකරු සහ ප්‍රතිලාභී හිමිකරු පිළිබඳ පහත දැක්වෙන තොරතුරු ලබා ගත යුතු ය :-

(අ) සම්පූර්ණ නම ;

(ආ) ස්ථිර පදිංචි ස්ථානයේ ලිපිනය හෝ තැපැල් ලිපිනය ;

(ඇ) රැකියාව, සේවායෝජකගේ හෝ ව්‍යාපාරයේ හෝ ප්‍රධාන කටයුත්තේ නම ;

(ඈ) නිල පුද්ගලික හැඳුනුම්පත් අංකය හෝ ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය වැනි ගනුදෙනුකරුගේ හෝ ප්‍රතිලාභී හිමිකරුගේ ඡායාරූපයක් දරන වෙනත් ඕනෑම අනන්‍යතා ලේඛනයක් ;

(ඉ) උපන් දිනය ;

(ඊ) ජාතිය ;

(උ) අරමුදල් මූලාශ්‍ර ;

(ඌ) ගනුදෙනුවේ අරමුණ ;

(එ) දුරකථන අංක (නිවස, කාර්යාලය හෝ ජංගම).

12. සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින් ම, මුල් ලේඛනය සහ එකී ලේඛනයේ පිටපතක් ඉදිරිපත් කරන ලෙසට ගනුදෙනුකරුට හෝ ප්‍රතිලාභී හිමිකරුට නියම කිරීමෙන්, 11 වන රීතියේ (ඈ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ලේඛන සත්‍යායනය කළ යුතු ය.

**සත්‍යායනය කවර කාල පරාස තුළ දී කළ යුතු ද යන්න**

13. සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින් ම, ගනුදෙනුකරුවකු සමග ව්‍යාපාරික සම්බන්ධතාවකට එළඹීමට පෙර හෝ ව්‍යාපාරික සම්බන්ධතාවය ඇතිකර ගන්නා අතරතුර හෝ ගනුදෙනුකරුගේ සහ ප්‍රතිලාභී හිමිකරුගේ අනන්‍යතාවය තහවුරු කරගත යුතු ය.

14. යම් ගනුදෙනුකරුවකු සම්බන්ධයෙන් මුදල් විශුද්ධිකරණ අවදානමක් හෝ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානමක් පිළිබඳව මූල්‍ය නොවන ව්‍යාපාරයට යම් සැකයක් ඇතිවන අවස්ථාවකදී සහ නිසි උද්යෝගය පිළිබඳ පියවර අනුගමනය කිරීම මගින් ගනුදෙනුකරු වෙත හෝඩුවාවක් ලැබෙන බවට සාධාරණ ලෙස විශ්වාස කළ හැකි අවස්ථාවක දී, මූල්‍ය ආයතනය විසින් ගනුදෙනුව ඉදිරියට ගෙනයාමට හැකි නමුත්, පනතේ 7 වන වගන්තියට අනුකූලව වහාම සැක කටයුතු ගනුදෙනු වාර්තාවක් ගොනු කරනු ලැබිය යුතුය.

15. ගනුදෙනුකරුවකු හෝ ප්‍රතිලාභී හිමිකරුවකු අවදානම අඩු අයකු ලෙස ගණනය කරන අවස්ථාවක දී, මූල්‍ය නොවන ව්‍යාපාරය විසින් 11 වන රීතියේ නිශ්චිතව දක්වා ඇති අවම තොරතුරු ලබා ගැනීම මගින් නිසි උද්‍යෝගයේ පියවර අදාළ කර ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

**ප්‍රවර්ධිත නිසි උද්‍යෝගය**

16. මූල්‍ය නොවන සෑම ව්‍යාපාරයක් විසින් ම, ගනුදෙනුකරුවකු සඳහා තක්සේරු කරන ලද මුදල් විශුද්ධිකරණ අවදානම සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානම වැඩි අවදානමක් ලෙස ගණනය කරනු ලැබ ඇති අවස්ථාවක දී, 11 වන නීතියේ නිශ්චිතව දක්වා ඇති පියවර වලට අමතරව පහත දැක්වෙන ප්‍රවර්ධිත නිසි උද්‍යෝගය පිළිබඳ පියවර ගනු ලැබිය යුතු ය :-

(අ) ගනුදෙනුකරු සහ ප්‍රතිලාභී හිමිකරු පිළිබඳව අමතර තොරතුරු ලබා ගැනීම (උදාඃ- වත්කම් ප්‍රමාණය සහ පොදු දත්ත සමුදායකින් ලබාගත් වෙනත් තොරතුරු);

(ආ) ගනුදෙනුකරු සමඟම එම ව්‍යාපාරික සම්බන්ධතාව ඇති කර ගැනීමට පෙර හෝ වත්මන් ගනුදෙනුකරුවකු සමඟ අඛණ්ඩව එවැනි ව්‍යාපාරික සම්බන්ධතාවක් පවත්වාගෙන යාමට පෙර, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයක් දරන්නන් සිටී නම්, එම කළමනාකාරීත්වයේ අනුමතය ලබා ගැනීම;

(ඇ) බලාපොරොත්තු වන ව්‍යාපාරික සම්බන්ධතාවයේ ස්වාභාවය පිළිබඳව අමතර තොරතුරු ලබා ගැනීම;

(ඈ) ගනුදෙනුකරු සහ වැඩදායී අයිතිකරු හඳුනාගැනීමේ දත්ත නිතිපතා යථාවත් කිරීම; සහ

(ඉ) අපේක්ෂිත හෝ සිදුකරන ලද ගනුදෙනු පිළිබඳ හේතු විමසා වාර්තා තැබීම.

**නෛතික තැනැත්තන් සහ නෛතික වැඩපිළිවෙළ**

17. සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින් ම, නෛතික තැනැත්තකු වන හෝ නෛතික වැඩපිළිවෙළක් වන ගනුදෙනුකරුවකු සම්බන්ධයෙන් -

(අ) ගනුදෙනුකරුගේ ව්‍යාපාර ස්වභාවය එහි අයිතිය සහ පාලන ව්‍යුහය තේරුම් ගත යුතුය;

(ආ) ගනුදෙනුකරු හඳුනාගෙන පහත දැක්වෙන තොරතුරු මාර්ගයෙන් ඔහුගේ අනන්‍යතාවය සත්‍යායනය කළ යුතුය:-

(i) නෛතික තැනැත්තාගේ හෝ නෛතික වැඩපිළිවෙළහි නම, වර්ගය සහ ගනුදෙනුකරු සිටින බව තහවුරු කිරීමට, සමාගම් පත්‍රය, ව්‍යවස්ථාවලිය, සංස්ථාගත කිරීමේ සහතික පත්‍රය හෝ ලියාපදිංචි කිරීමේ ලේඛනය වැනි යමක් (සත්‍ය පිටපත් ලෙස සහතික කළ පිටපත් හෝ නොතාරිස්වරයකු විසින් ලියා අත්සන් කරන ලද පිටපත් පිළිගත හැකි ය) හෝ ගනුදෙනුකරුගේ අනන්‍යතාවය සත්‍යායනය කළ හැකි වෙනත් යම් විශ්වසනීය සඳහන් කිරීම් ;

(ii) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු දරන අදාළ තැනැත්තන්ගේ නම් මෙන් ම, ගනුදෙනුකරු කෙරෙහි නියාමනයක් සහ බැඳීමක් ඇති කරන්නා වූ අධ්‍යක්ෂවරුන්ගේ යෝජනා සම්මතයක් වැනි බලතල;

(iii) ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය ඊට වෙනස් නම්, එහි ලිපිනය.

18. නෛතික තැනැත්තකුගේ අත්‍යන්ත පාලන හිමිකාරත්ව සම්බන්ධතාව සහිත ස්වභාවික තැනැත්තකු සිටී නම්, එම තැනැත්තා හඳුනාගැනීමේ අරමුණින්, මූල්‍ය නොවන ව්‍යාපාර විසින්, අවම වශයෙන් පහත දැක්වෙන විස්තර ලබාගෙන තහවුරු කර ගැනීම සඳහා සාධාරණ පියවර ගනු ලැබිය යුතුය:-

(අ) සියලු අධ්‍යක්ෂවරුන් සහ සියයට දහයකට වැඩි ස්කන්ධ ප්‍රාග්ධන සම්බන්ධතාවක් සහිත සියලු කොටස් හිමියන් හඳුනාගෙන එවැනි අධ්‍යක්ෂවරුන් සහ කොටස් හිමියන්ගේ යම් වෙනසක් වූ විට දැනුම් දෙන ලෙස නෛතික තැනැත්තා වෙත නියම කරනු ලැබීම;

(ආ) අත්‍යන්ත පාලන හිමිකාරත්ව සම්බන්ධතාව සහිත තැනැත්තා ප්‍රතිලාභී හිමිකරු වේ ද යන්න පිළිබඳ සැකයක් ඇතිවන අවස්ථාවක දී හෝ හිමිකාරත්ව සම්බන්ධතාවය හරහා පාලනය කරනු ලබන ස්වභාවික තැනැත්තකු නොමැති අවස්ථාවකදී, නෛතික තැනැත්තාගේ පාලනය වෙනත් මූලාශ්‍ර හරහා ක්‍රියාත්මක කරනු ලබන ස්වභාවික තැනැත්තකු සිටී නම්, ඒ තැනැත්තාගේ අනන්‍යතාවය;

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයක් මගින් හෝ අන්‍යාකාරයකින් නෛතික පුද්ගලයා හෝ නෛතික වැඩපිළිවෙළ නියෝජනය කිරීම සඳහා යම් තැනැත්තකු වෙත ලබාදුන් බලය පැවරීමක් කර තිබේ ද යන්න;

(ඈ) ඉහතින් වූ විධිවිධාන යටතේ කිසිදු ස්වාභාවික තැනැත්තකු හඳුනාගත නොහැකි වන අවස්ථාවක, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තත්ත්වය දරන අදාළ ස්වභාවික තැනැත්තන්ගේ අනන්‍යතාවය;

(ඉ) නෛතික තැනැත්තකුගේ පාලන සම්බන්ධතාවය වෙනත් නෛතික තැනැත්තකු සතු කර ඇති අවස්ථාවකදී, මූල්‍ය නොවන ව්‍යාපාරය විසින් එම නෛතික තැනැත්තාගේ පාලනය පවරනු ලැබ ඇති ස්වභාවික තැනැත්තා හඳුනාගැනීම.

19. නෛතික වැඩපිළිවෙළක ප්‍රතිලාභී හිමිකරුවන් හඳුනාගැනීම සඳහා මූල්‍ය නොවන ව්‍යාපාරය විසින් පහත දැක්වෙන විස්තර ලබාගෙන තහවුරු කර ගැනීම සඳහා ගත හැකි සෑම පියවරක්ම ගනු ලැබිය යුතු ය:-

(අ) භාර සඳහා, භාරයේ නිර්මාතෘගේ අනන්‍යතාවය, භාරකරුවන්ගේ, ප්‍රතිලාභියාගේ හෝ ප්‍රතිලාභී පන්තියේ අනන්‍යතාවය සහ භාරයේ අත්‍යන්ත සක්‍රීය පාලනය ක්‍රියාත්මක කරනු ලබන වෙනත් යම් තැනැත්තකුගේ අනන්‍යතාව; පාලන ජාලයක් හරහා හෝ හිමිකාරත්ව ජාලයක් හරහා පාලනය කරන තැනැත්තන් ඇතුළුව; හෝ

(ආ) වෙනත් ආකාරයේ නෛතික වැඩපිළිවෙළ සඳහා සමාන හෝ සම තත්ත්වයේ තැනැත්තන්ගේ අනන්‍යතාවය.

**ස්වාභාවික තැනැත්තන් භෞතිකව පෙනී නොසිටින අවස්ථාවක සිදුවන ගනුදෙනු**

20. (1) මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින්, මුහුණට මුහුණලා සිදු නොකරන ව්‍යාපාරික සම්බන්ධතා හෝ ගනුදෙනු සමඟ සම්බන්ධ වූ යම් විශේෂිත අවදානම්වලට පිළියම් යෙදීමට ක්‍රියා පටිපාටියක් සකස් කර ඇත්නම් පමණක් එවැනි මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින්, ගනුදෙනුකරුවකු සමඟ මුහුණට මුහුණලා සිදු නොකරන ව්‍යාපාරික සම්බන්ධතාවක් හෝ ගනුදෙනුවක් ඇති කරගනු ලැබිය හැකිය. එවැනි ගනුදෙනුවකරුවන් ඉහළ අවදානමක් ඇති ගනුදෙනුකරුවන් ලෙස හඳුනාගනු ලැබිය යුතු අතර 16 වන රීතිය අනුව කටයුතු කරනු ලැබිය යුතු ය.

(2) (1) වන ඡේදය සඳහන් කරන ලද ක්‍රියාපාටිපාටියේ –

(අ) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය හරහා ව්‍යාපාරික සම්බන්ධතා හෝ ගනුදෙනු ඇති කර ගැනීමේ දී සහ මෙහෙයවීමේදී යොමුවන අවදනම් තත්ත්වයන් මගහැරීම පිණිස වූ පූර්වාරක්ෂණ පියවර ඇතුළත් විය යුතු ය;

(ආ) මුහුණට මුහුණලා ව්‍යාපාරික සම්බන්ධතාවල හෝ ගනුදෙනුවල යෙදෙන ගනුදෙනුකරුවන් හඳුනාගැනීමට හා ඔවුන්ගේ අනන්‍යතාව සත්‍යායනය කිරීමට යොදා ගන්නා පියවරවලට සමාන, ඵලදායීතාවක් ඇති, යෝග්‍ය හඳුනාගැනීමේ හා සත්‍යායනය කිරීමේ පියවර, මුහුණට මුහුණලා සිදු නොකරන ව්‍යාපාරික සම්බන්ධතාවල හෝ ගනුදෙනුවල යෙදෙන ගනුදෙනුකරුවන්ට ද තිබිය යුතුය;

(ඇ) මුහුණට මුහුණලා සිදු නොකරන ව්‍යාපාරික සම්බන්ධතා හෝ ගනුදෙනු ඇතිකර ගැනීමේ දී සහ මෙහෙයවීමේ දී යොමු විය හැකි සහ සිදුවීමට ශක්‍යතාවක් ඇති මුදල් විශුද්ධිකරණයේ සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානම් නියාමය කිරීමේ සහ වාර්තා කිරීමේ යාන්ත්‍රණ ඇතුළත් විය යුතු ය.

**සමාජශාලා, සමිති සහ සංගම්**

21. සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින් ම, සමාජශාලා, සමිති හෝ සංගම් වන ගනුදෙනුකරුවන්ගෙන් , ඒ සමාජශාලා, සමිති හෝ සංගම්වල අනන්‍යතා ලේඛන සහ සංස්ථාපනය කිරීමේ ලේඛන හෝ වෙනත් සමාන ලේඛන සහ ඒ සමාජශාලා, සමිති හෝ සංගම්වල, ලියාපදිංචි කිරීමේ සහතික සහ ඒවා නියෝජනය කිරීමට බලය දෙන ලද නිලධරයන්ගේ හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හඳුනාගැනීමේ ලේඛන ද ඇතුළුව ලබා ගත යුතු ය.

**රාජ්‍ය නොවන සංවිධාන, ලාභ නොලබන සංවිධාන හෝ පුණ්‍ය ආයතන**

22. (මෙහි මින් මතු "එන්.ජී.ඕ යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය නොවන සංවිධානයක්, (මෙහි මින් මතු "එන්.පී.ඕ" යනුවෙන් සඳහන් කරනු ලබන) ලාභ නොලබන සංවිධානයක් සහ පුණ්‍ය ආයතනයක් සමඟ ව්‍යාපාරික සම්බන්ධතාවකට එළඹීමේ දී, සෑම මූල්‍ය ආයතනයක් විසින් ම, ප්‍රවර්ධිත නිසි උද්යෝගය පිළිබඳ පියවර අනුගමනය කරනු ලැබිය යුතු ය.

23. 41 වන රීතියේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි ලැයිස්තුවක නමෝද්දිෂ්ට යම් අස්ථිත්වයක් හෝ තැනැත්තකු සමඟ එම නමින් ම හෝ වෙනත් නමකින් එන්.ජී.ඕ, එන්. පී. ඕ. හෝ පුණ්‍ය ආයතනයක්, එවැනි ආයතනයක බලයලත් අත්සන්කරුවන්, ඒ ආයතනයක පාලන මණ්ඩලවල සාමාජිකයන් සහ ප්‍රතිලාභී හිමිකරුවන්, සම්බන්ධතා නොපවත්වන බවට වගබලා ගැනීම සඳහා, එන්. ජී. ඕ., එන්. පී. ඕ. හෝ පුණ්‍ය ආයතනයක සියලු වත්මන් සම්බන්ධතා සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින් ම සමාලෝචනය කර නියාමනය කරනු ලැබිය යුතු ය.

**දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තන් (PEPs)**

24. දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තන් හෝ ඔවුන්ගේ පවුල්වල සමාජිකයන් සහ සමීප ආශ්‍රිතයන් සම්බන්ධයෙන් වන විට, සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින් ම-

(අ) ගනුදෙනුකරු හෝ ප්‍රතිලාභී හිමිකරු දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තකු ද යන්න තීරණය කිරීම සඳහා යෝග්‍ය අභ්‍යන්තර ප්‍රතිපත්ති, කාර්ය පටිපාටි සහ පාලන ක්‍රම ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය;

(ආ) ගනුදෙනුකරු හෝ ප්‍රතිලාභී හිමිකරු දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තකු වන අවස්ථාවකදී ව්‍යාපාර සම්බන්ධතා සඳහා ඇතුළත් වීමට හෝ ව්‍යාපාර සම්බන්ධතා අඛණ්ඩව පවත්වාගෙන යාමට ව්‍යාපාරයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයක් තිබේ නම්, එහි අනුමතය ලබා ගත යුතුය;

(ඇ) ගනුදෙනුකරු හෝ ප්‍රතිලාභී හිමිකරු දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තකු වූ අවස්ථාවක, අරමුදල්වල සහ සම්පත්වල මූලාශ්‍ර යෝග්‍ය ක්‍රම මගින් තහවුරු කිරීම සිදු කළ යුතුය; සහ

(ඈ) මූල්‍ය නොවන ව්‍යාපාරය සමඟ ඔවුන්ගේ ව්‍යාපාරික සම්බන්ධතා කෙරෙහි ප්‍රවර්ධිත නිසි උද්යෝගයෙන් ක්‍රියා කරමින් නියාමනය කිරීම සිදු කළ යුතුය.

**වත්මන් ගනුදෙනුකරුවන්**

25. සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින්ම, පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගනිමින් තක්සේරු කරනු ලබන ගනුදෙනුකරුගේ සැලකිලි යුතු භාවය සහ අවදානම මත පදනම් වී වත්මන් ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගය ක්‍රියාත්මක කළ යුතුය:-

(අ) ගනුදෙනුවේ විශේෂත්වය ඇතුළුව ගනුදෙනුව හා බැඳුනු ස්වභාවය සහ අවස්ථානුගත කරුණු;

(ආ) ගනුදෙනුව හෝ ව්‍යාපාරික සම්බන්ධතාව ක්‍රියාත්මක වන මාර්ගයේ යම් සැලකිය යුතු වෙනස්කම්; හෝ

(ඇ) ගනුදෙනුකරු පිළිබඳව හෝ ගනුදෙනුකරුගේ තොරතුරුවල යම් වෙනස්වීමක් පිළිබඳ දැනට පවතින තොරතුරු ඌනතාවය.

26. සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින්, වත්මන් ගනුදෙනුකරුවකු කෙරෙහි කලින් නිසි උද්යෝගය පිළිබඳ පියවර ගෙන තිබේද, ඒ කවර කාලයක ද සහ ප්‍රමාණවත් දත්ත ලබාගෙන තිබේ ද යන කරුණු සැලකිල්ලට ගනිමින් යෝග්‍ය කාලවල දී එවැනි ගනුදෙනුකරුවකු පිළිබඳ නිසි උද්යෝගය පිළිබඳ පියවර ගත යුතුය.

27. යම් වත්මන් ගනුදෙනුකරුවකු විසින් නිසි උද්යෝගයට ආදාළව සෑහීමට පත්විය නොහැකි තොරතුරු සපයනු ලබන අවස්ථාවක දී, එවැනි ගනුදෙනුකරුවකු සමඟ පවතින සම්බන්ධතාවය ඉහළ අවදානමක් දරන ගනුදෙනුකාර සම්බන්ධතාවක් ලෙස සලකනු ලැබිය යුතු අතර ප්‍රවර්ධිත නිසි උද්යෝගය පිළිබඳ පියවර සඳහා යටත් විය යුතුය.

**ඉහළ අවදානම් සහිත රටවල ගනුදෙනුකරුවන්**

28. (1) ඉහළ අවදානම් සහිත රටවල ගනුදෙනුකරුවන් සහ මූල්‍ය ආයතනවල ව්‍යාපාරික සම්බන්ධතා සහ ගනුදෙනු සඳහා සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින් ම ප්‍රවර්ධිත නිසි උද්යෝගය පිළිබඳ පියවර අදාළ කරගනු ලැබිය යුතු ය.

(2) විදේශ කටයුතු විෂයය පවරා ඇත්තා වූ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විමසා, මූල්‍ය බුද්ධි ඒකකය විසින් –

(අ) මූල්‍ය කාර්ය සාධක බලකායේ ලැයිස්තුගත කිරීම් මත පදනම්ව, හෝ

(ආ) මුදල් විශුද්ධිකරණයට එරෙහිවීමේ ප්‍රතිපත්ති සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රතිපත්ති ක්‍රමෝපායවල ඌනතා පැවතීම සහ එම ඌනතා සඳහා ප්‍රතිකර්ම සැලසීමේ ප්‍රමාණවත් ප්‍රගතියක් නොපැවතීම සැලකිල්ලට ගෙන, ස්වාධීනව,

(1) වන ඡේදයේ සඳහන් ඉහළ අවදානම් සහිත රටවල්වල ලැයිස්තුව එහි නිල වෙබ් අඩවියේ පළ කළ යුතුය.

29. 28 වන රීතියේ (2) වන ඡේදයේ සඳහන් ඉහළ අවදානම් සහිත රටවල් පිළිබඳ ලැයිස්තුවේ නිශ්චිතව දක්වා ඇති රටවල් සඳහා ප්‍රවර්ධිත නිසි උද්යෝගය පිළිබඳ පියවරවලට අතිරේකව, ලැයිස්තුගත කරන ලද ඉහළ අවදානම් සහිත රටවල අවදානමේ ස්වභාවයට අනුරූපව, සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින් ම පහත දැක්වෙන පරිදි යෝග්‍ය ප්‍රති පියවර අදාළ කර ගනු ලැබිය යුතු ය:-

(අ) ඉහළ අවදානමක් ඇති රටවල හඳුනාගත් තැනැත්තන් හෝ නෛතික වැඩ පිළිවෙළ සමග ව්‍යාපාර සම්බන්ධතා හෝ මූල්‍ය ගනුදෙනු සීමා කිරීම;

(ආ) මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිශ්චිතව දක්වනු ලබන වෙනත් යම් පියවර ගැනීම.

**නව තාක්ෂණය (නිෂ්පාදන, සේවා සහ ව්‍යාපාර පරිචයන්)**

30. බෙදාහැරීමේ යාන්ත්‍රණ සහ නව හෝ සංවර්ධනය වෙමින් පවතින තාක්ෂණය භාවිත කිරීම ද ඇතුළුව, නව නිෂ්පාදන හා පෙර පැවති නිෂ්පාදන යන දෙකම සඳහා අලුත් නිෂ්පාදනවල, සේවාවල සහ ව්‍යාපාර පරිචයන් හි දියුණුවට අදාළව මුදල් විශුද්ධිකරණ අවදානම සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානම සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින් ම, හඳුනාගෙන තක්සේරු කිරීම කළ යුතු ය.

31. සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින් ම,

(අ) නව නිෂ්පාදන, සේවා සහ තාක්ෂණ ක්‍රම ආරම්භ කිරීමට හෝ භාවිතා කිරීමට පෙරාතුව අවදානම් තක්සේරු කිරීම් කරනු ලැබිය යුතු ය; සහ

(ආ) නව නිෂ්පාදන සහ නව ව්‍යාපාරික පරිචයන් දියුණු කිරීමට අදාළව පැන නැගිය හැකි අවදානම් කළමණාකරණයට සහ ඒවා අවම කිරීමට යෝග්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

**නිරන්තර නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම**

32. මූල්‍ය නොවන සෑම ව්‍යාපාරයක් විසින් ම, ස්වකීය ගනුදෙනුකරුවන් සමග පවත්වනු ලබන යම් ව්‍යාපාරික සම්බන්ධතාවක් මත -

(අ) ඒ සම්බන්ධතාව පවතින අතරතුර කරනු ලබන ගනුදෙනු සම්බන්ධයෙන්, අවශ්‍ය වන අවස්ථාවක දී අරමුදල් මූලාශ්‍ර ද ඇතුළුව සිදු කරගෙන යනු ලබන ගනුදෙනුව, ගනුදෙනුකරු, ඔවුන්ගේ ව්‍යාපාර සහ අවදානම් පැතිකඩ සම්බන්ධයෙන් මූල්‍ය නොවන ව්‍යාපාරයේ දැනුවත්භාවයට අනුකූල වන්නේ ද යන්න තහවුරු කිරීමට සියුම් නිරීක්ෂණයෙන් කටයුතු කිරීම මගින්;

(ආ) පවතින වාර්තාවල සමාලෝචනයක් සිදු කිරීම මගින්, විශේෂයෙන් ඉහල අවදානමක් ඇති රටවල ගනුදෙනුකරුවන් සඳහා නිසි උද්යෝගය පිළිබඳ කාර්ය පටිපාටිය යටතේ රැස්කරන ලේඛන, දත්ත හෝ තොරතුරු යාවත්කාලීනව සහ අදාළ වන පරිදි තබා ගැනීමේ වග බලා ගැනීමෙන්; සහ

(ඇ) (i) සැක කටයුතු බව පෙනී යන;

(ii) ගනුදෙනුවේ ප්‍රමාණය හා සංසන්දනය කරන විට අපේක්ෂිත ක්‍රියාකාරකම් වර්ගය සහ ව්‍යාපාර මාදිලිය සමග අනනුකූල වන;

(iii) කිසිදු විද්‍යාමාන ආර්ථික අරමුණක් නොමැති; හෝ

(iv) විශේෂයෙන් සංකීර්ණ සහ විශාල ගනුදෙනුවක් හෝ ගනුදෙනුවලට හෝ ඉහළ අවදානමක් ඇති ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් ඒ ගනුදෙනුවල නීත්‍යානුකූලභාවය පිළිබඳ සැකයක් උපදවන්නා වූ,

යම් ගනුදෙනුවක හෝ ව්‍යාපාරික සම්බන්ධතාවක ආර්ථික පසුබිම සහ අරමුණ සැලකිල්ලට ගැනීමෙන්,

පනතේ 5 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, නිරන්තර නිසි උද්යෝගයෙන් සහ සියුම් නිරීක්ෂණයෙන් කටයුතු කළ යුතු ය.

33. ගනුදෙනුකරුවන් පිළිබඳ උද්යෝගයෙන් හෝ ප්‍රවර්ධිත නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ යුතු වාර ගණන, අවදානම් පැතිකඩ සහ ගනුදෙනුවේ ස්වභාවය මත පදනම් වී ගනුදෙනුකරුගෙන් යොමුවන මුදල් විශුද්ධිකරණ අවදනමට සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදනමට සමානුපාතික විය යුතුය.

34. සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින්ම, ප්‍රවර්ධිත නිරන්තර නිසි උද්යෝගය ක්‍රියාත්මක කිරීමේදී යොදනු ලබන පාලන ක්‍රම සංඛ්‍යාව සහ කාල පරාසය වැඩි කිරීම සිදු කළ යුතු අතර ඉදිරි පරීක්ෂණ අවශ්‍ය වන රටාවක වූ ගනුදෙනු තෝරා ගැනීම සිදු කළ යුතුය.

**තුන්වන පාර්ශ්වය මත විශ්වාසය තැබීම**

35. මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින්, නිසි උද්යෝගය පිළිබඳ පියවර ක්‍රියාත්මක කිරීමේ දී, මූල්‍ය නොවන ව්‍යාපාරය විසින් ම එසේ කිරීම ප්‍රායෝගික නොවන අවස්ථාවක දී, ගනුදෙනුකරු හඳුනාගැනීම, ප්‍රතිලාභී හිමිකරු හඳුනා ගැනීම, ව්‍යාපාරයේ ස්වභාවය තේරුම් ගැනීම හෝ ව්‍යාපාරය ආරම්භ කිරීම ඇතුළුව, නිසි උද්යෝගය පිළිබඳ පියවර ක්‍රියාත්මක කිරීමේදී තුන්වන පාර්ශ්වයක් වන මූල්‍ය ආයතනයක් හෝ මූල්‍ය නොවන ව්‍යාපාරයක් මත රඳා පැවතීමට හැකිය.

36. යම් මූල්‍ය නොව ව්‍යාපාරයක්, නිසි උද්යෝගය පිළිබඳ පියවර ක්‍රියාත්මක කිරීමට තුන්වන පාර්ශ්වයේ මූල්‍ය ආයතනයක් හෝ මූල්‍ය නොවන ව්‍යාපාරයක් මත රඳා පවතින අවස්ථාවක දී, තුන්වන පාර්ශ්වය මත රඳ පවතින්නා වූ මූල්‍ය නොවන ව්‍යාපාරය මත නිසි උද්යෝගය පිළිබඳ පරම වගකීම පැවතිය යුතු අතර, ඒ මූල්‍ය නොවන ව්‍යාපාරය විසින් -

(අ) නිසි උද්යෝගය පිළිබඳ පියවරවලට අදළ අවශ්‍ය තොරතුරු වහාම ලබාගැනීම කරනු ලැබිය යුතු ය;

(ආ) ඉල්ලීමක් කිරීමෙන් පසුව, ප්‍රමාදයකින් තොරව තුන්වන පාර්ශ්වයෙන් නිසි උද්යෝගය පිළිබඳ අවශ්‍යතාවලට අදළ හඳුනාගැනීමේ දත්ත සහ වෙනත් අදළ ලේඛනවල පිටපත් ලබාගැනීමේ හැකියාව පිළිබඳ සෑහීමකට පත්වන පරිදි පියවර ගනු ලැබීම කළ යුතුය;

(ඇ) තුන්වන පාර්ශ්වය විධිමත් කර ඇති බවට, අධීක්ෂණය කර ඇති බවට හෝ නියාමනය කර ඇති බවට ද, පනතට අනුව සහ ඒ යටතේ සාදනු ලබන රීතිවලට අනුව නිසි උද්යෝගය ක්‍රියාත්මක කිරීමට සහ වාර්තා තබාගැනීමේ අවශ්‍යතාවයන්ට අනුකූල වීමට පියවර පවතින බවට සෑහීමට පත්වීම කරනු ලැබිය යුතු ය.

37. තුන්වන පාර්ශ්වයන් මත රඳා පවතින්නා වූ සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් වෙත ම-

(අ) මුදල් විශුද්ධිකරණයට එරෙහිවීමේ සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රතිපත්තිවල ක්‍රමෝපාය ඌනතා පවතින රටවල් වශයෙන් මූල්‍ය කාර්ය සාධක බලකය විසින් හඳුනාගෙන ඇති රටවල් ද ඇතුළුව, ජාත්‍යන්තර මූල්‍ය පද්ධතිය කෙරෙහි ඇති මුදල් විශුද්ධිකරණ අවදානම හෝ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීමේ අවදානම අවම කිරීමට හැකියාව සහිත අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ සහ කාර්ය පටිපාටි තිබිය යුතුය;

එසේ වුව ද, මේ රීතිවල කාර්යය සඳහා තුන්වන පාර්ශ්වයක් මත රඳා පවතින්නා වූ, තනි වෘත්තිකයන් හෝ තනි හිමිකරුවන් වන නීතිඥවරු, නොතාරිස්වරු, වෙනත් ස්වාධීන නීති වෘත්තිකයන් සහ ගණකාධිකාරිවරු විසින්, අදළ ක්ෂේත්‍රයට ඉදිරිපත් වූ අවදානම් මට්ටම සහ මේ ඡේදයට අනුකූලව ක්‍රියා කිරීමට වගබලා ගැනීමේදී පැන නැගිය හැකි ප්‍රායෝගික දුෂ්කරතාවයන් සැලකිල්ලට ගනිමින්, කලින් කලට, පනතට සහ ඒ යටතේ නිකුත් කරන ලද යම් නියෝග හෝ රීතිවලට යටත්ව මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය.

(ආ) රඳා පැවතීමට බලාපොරොත්තු වන තුන්වන පාර්ශ්වයක රට නිශ්චය කිරීමේ දී, රටෙහි අවදානම් මට්ටම පිළිබඳ පවතින තොරතුරු පිළිබඳ සලකා බැලිය යුතුය.

## III වන කොටස

### වාර්තා තැබීම

38. (1) සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින් ම පනතේ 5 වන සහ 6 වන වගන්තිවලට අනුකූලව, ගණුදෙනුවලට අදළ වන්නා වූ ද, විශේෂයෙන් නිසි උද්යෝගය පිළිබඳ ක්‍රියාවලිය තුළදී ලබාගත්තා වූ ද, යම් ගිණුම් , ලිපිගොනු, ව්‍යාපාරික ලිපි සහ ලේඛන ද ඇතුළුව, ගනුදෙනුකරුවන්ගේ සහ ප්‍රතිලාභී හිමිකරුවන්ගේ අනන්‍යතාවය සත්‍යායනය කිරීමට භාවිත කරන ලද ලේඛනවල සහ සිදු කරන ලද යම් විශ්ලේෂණයක ප්‍රතිඵලවල අදළ වාර්තා පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(2) එසේ පවත්වාගෙන යනු ලබන සහ තබාගෙන ඇති වාර්තා යථාවත් කළ යුතුය.

39. සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින් ම වාර්තා වසර හයකට වැඩි කාල සීමාවක් සඳහා තබා ගනු ලැබිය යුතු ය. යම් වාර්තාවක් පවතින විමර්ශනයකට හෝ නඩු පැවරීමකට යටත් වන විට හෝ අධිකරණයකට හෝ වෙනත් නිසි අධිකාරියක් වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන අවස්ථාවක දී, ඒ වාර්තා තවදුරටත් අවශ්‍ය නොවන බවට අදාළ අධිකාරිය විසින් මූල්‍ය නොවන ව්‍යාපාරයට දනුම් දෙන තෙක් එම වාර්තා තබා ගත යුතු ය.

40. සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින් ම, අදාළ වාර්තා, අධිකරණයක දී සාක්ෂියක් ලෙස ආවේශ්‍ය කර ගත හැකි සහ අධීක්ෂණ බලධාරීන්ට සහ නීතිය ක්‍රියාත්මක කරන අධිකාරීන්ට, ඒ අධිකාරීන් විසින් නිශ්චිතව සඳහන් කරන ලද කාල සීමාවන්ට අනුකූල වන ආකාරයකින් ඒ වාර්තා ලබාගත හැකි ආකෘතියකින් පවත්වාගෙන යා යුතු ය.

## IV වන කොටස

## විවිධ

41. සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින් ම, පනතේ සහ මෙම රීතිවල සඳහන් නියම කිරීම්වලට අනුකූලව ක්‍රියා කරනු ලබන බවට වගබලා ගැනීම සඳහා අනුකූලතා නිලධරයකු පත්කිරීමේ දී ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිලධරයකු පත්කරනු ලැබිය හැකි ය.

42. සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින් ම, ත්‍රස්තවාදය හා ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම ද, සමූල ඝාතක අවි ව්‍යාප්තිය සහ ඊට මුදල් සැපයීම කෙරෙහි මූල්‍ය සම්බාධක පැනවීම ඉලක්ක කරගත් නම් ඇතුළත් ලැයිස්තුවක් සම්බන්ධයෙන් 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතට අනුකූලව නිකුත් කරන ලද යම් නමෝද්දිෂ්ට ලැයිස්තුවක යම් ගනුදෙනුකරුවකු හෝ ප්‍රතිලාභියකුගේ නම ඇතුළත්ව තිබේ ද යන්න තහවුරු කර ගත යුතු ය.

43. මෙම රීතිවල -

''ප්‍රතිලාභියා'' යන්නෙන්, ගනුදෙනුවක ප්‍රතිලාභයට හිමිකම් කියන තැනැත්තකු අදහස් වේ;

''ප්‍රතිලාභී හිමිකරු'' යන්නෙන්, ගනුදෙනුකරුවකුගේ අත්‍යන්ත හිමිකාරත්වය හෝ පාලනය සහිත ස්වාභාවික තැනැත්තකු, නැතහොත් ගනුදෙනුව පවත්වනු ලබන්නේ යම් තැනැත්තකුගේ ප්‍රතිලාභය සඳහා ද ඒ තැනැත්තා අදහස් වන අතර යම් තැනැත්තකුගේ හෝ නෛතික වැඩපිළිවෙලක සක්‍රීය ලෙස අත්‍යන්ත පාලනය දරනු ලබන තැනැත්කු ද ඊට ඇතුළත් වේ;

''සමීප ආශ්‍රිතයන්'' යන්නට -

(අ) නෛතික අස්ථිත්වවල සහ නෛතික වැඩපිළිවෙලවල හවුල් ප්‍රතිලාභී සම්බන්ධතාවය හෝ වෙනත් යම් සමීප ව්‍යාපාරික සම්බන්ධතා සහිත ස්වාභාවික තැනැත්තකු; සහ

(ආ) ප්‍රතිලාභී අයිතිකරු ස්වභාවික තැනැත්තකු වන්නා වූ ද, එම තැනැත්තා හෝ ඔහුගේ පවුලේ සමීප සාමාජිකයන්ගේ ප්‍රතිලාභය වෙනුවෙන් සකස් කර ඇති ලෙස සලකනු ලබන්නා වූ ද යම් නෛතික තැනැත්කු හෝ නෛතික වැඩපිළිවෙලක්,

ඇතුළත් වේ;

''පාලන සම්බන්ධතාවය'' යන්නෙන්, යම් නෛතික තැනැත්කුගේ ප්‍රාග්ධනයෙන් සියයට දහයකට වැඩි ප්‍රමාණයක් සැපයීම මඟින් උපචිත වන යම් සම්බන්ධතාවක් අදහස් වේ;

''වත්මන් ගනුදෙනුකරු'' යන්නෙන්, මෙම රීති බලාත්මක වන දින හෝ එදිනට පෙර ව්‍යාපාරික සම්බන්ධතා ආරම්භ කර ඇති ගනුදෙනුකරුවකු අදහස් වේ;

''මූල්‍ය කාර්ය සාධක බලකාය'' යන්නෙන්, මුදල් විශුද්ධිකරණයට, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමට සහ සමූල ඝාතක අවි සඳහා මුදල් සැපයීමට එරෙහිවීමේ ප්‍රතිපත්ති සංවර්ධනය සහ ප්‍රවර්ධනය කර ගෝලීය මූල්‍ය පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා වන ස්වාධීන අන්තර් රාජ්‍ය ආයතනයක් අදහස් වේ;

''පවුලේ සමීප සාමාජිකයා'' යන්නට, කලත්‍රයා, දරුවන් සහ ඔවුන්ගේ කලත්‍රයන් හෝ සහකරුවන් හෝ සහකාරියන්, දෙමාපියන්, සහෝදර සහෝදරියන් සහ ඔවුන්ගේ කලත්‍රයන් සහ මුණුබුරු මිනිපිරියන් සහ ඔවුන්ගේ කලත්‍රයන් ඇතුළත් වේ;

''නෛතික තැනැත්තන්'' යන්නෙන්, මූල්‍ය නොවන ව්‍යාපාරයක් සමඟ ස්ථිර ගනුදෙනුකාර සම්බන්ධතාවක් තහවුරු කිරීමට හැකියාව ඇති හෝ අන්‍යාකාරයකින් දේපළ අයත් වන යම් ස්වාභාවික තැනැත්තකු නොවන අස්ථිත්වයක් අදහස් වන අතර, එයට සමාගමක්, සංස්ථාවක්, පදනමක්, හවුල් ව්‍යාපාරයක් හෝ සංගමයක් ඇතුළත් වේ ;

''නෛතික වැඩපිළිවෙල'' යන්නට, ප්‍රකාශිත භාරයක්, භාරකාරත්ව ගිණුමක් හෝ නාමිකයකු ඇතුළත් වේ ;

''මුදල් විශුද්ධිකරණය'' යන්නෙන්, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව මුදල් විශුද්ධිකරණ වරද අදහස් වේ ;

''වරින් වර පැමිණෙන ගනුදෙනුකරු'' යන්නෙන්, වරින්වර ගනුදෙනුවල නිරතවන ගනුදෙනුකරුවකු අදහස් වේ ;

''එක් වරක් පැමිණෙන ගනුදෙනුකරු'' යන්නෙන්, එක් වාරයක දී යම් ගනුදෙනුවක හෝ ගනුදෙනුවල නිරතවන යම් ගනුදෙනුකරුවකු අදහස් වේ ;

''තැනැත්තා'' යන්නෙන්, ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු අදහස් වන අතර එයට සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයක් සහ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද ශාඛාවක් ඇතුළත් වේ ;

''දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තා'' යන්නෙන්, දේශීය වශයෙන් හෝ විදේශීය රාජ්‍යයක් විසින් හෝ ජාත්‍යන්තර සංවිධානයක් විසින්, ප්‍රමුඛ රජයේ කර්තව්‍ය පවරා ඇති යම් පුද්ගලයකු අදහස් වන අතර එයට යම් රාජ්‍යයක හෝ රජයක, ප්‍රධානියකු, දේශපාලනඥයකු, ජ්‍යෙෂ්ඨ රජයේ නිලධරයකු, අධිකරණ නිලධරයකු හෝ හමුදා නිලධරයකු හෝ රජය සතු සංස්ථාවක, රජයේ හෝ ස්වාධීන ආයතනයක ජ්‍යෙෂ්ඨ විධායක නිලධරයකු අදහස් වන අතර, මධ්‍යම මට්ටමේ හෝ කනිෂ්ඨ මට්ටමේ පුද්ගලයන් ඊට ඇතුළත් නොවේ ;

''අවදානම මත පදනම් වූ පිවිසුම'' යන්නෙන්, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානම කළමනාකරණය කිරීම සහ අවම කිරීම සඳහා වූ නිසි උද්යෝගය පිළිබඳ පියවර අදාළ කර ගැනීම සම්බන්ධයෙන් වූ විට, අඩු අවදානම් මට්ටමක් සහිත ගනුදෙනුකරුවන් සඳහා සරල කරන ලද නිසි උද්යෝගය පිළිබඳ පියවර භාවිත කිරීම සහ ඉහළ අවදානම් මට්ටමක් සහිත ගනුදෙනුකරුවන් සඳහා ප්‍රවර්ධිත නිසි උද්යෝගය පිළිබඳ පියවර භාවිත කිරීම අදහස් වේ ;

''සැක කටයුතු ගනුදෙනු වාර්තාව'' යන්නෙන්, පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව සැක කටයුතු ගනුදෙනුවක් හෝ එවැනි ගනුදෙනුවක් සඳහා තැත් කිරීමක් පිළිබඳ වාර්තාවක් අදහස් වේ ;

''ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම'' යන්නෙන්, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත යටතේ වරදක් සංයුක්ත වන ක්‍රියාවක් අදහස් වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.